# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1796/22 - 2013 පෙබරවාරි මස 08 වැනි සිකුරාදා - 2013.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51 III.

**මෝටර් වාහන පනත (203 වැනි අධිකාරය)**

මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2011 සැප්තැම්බර් මස 09 වැනි දින අංක 1722/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2011 මෝටර් වාහන (ගාස්තු) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 3 වන නියෝගයේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

" (3) (*ආ*) එහි 2 වන නියෝගයේ සඳහන් මෝටර් වාහනයක් පළමුවරට ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් -

(i) එම මෝටර් වාහනය ආනයනය කිරීමේ දින සිට ;

(ii) අවස්ථාවෝචිත පරිදි, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කර එකලස් කරන ලද මෝටර් රථය මිල දී ගත් දින සිට ;

(iii) රජයට හෝ අර්ධ - රාජ්‍ය සංවිධානයකට හෝ ශ්‍රී ලංකා රේගුවට අයත් ලියාපදිංචි නොකළ වාහන වෙන්දේසි කළ දින සිට ; හෝ

(iv) වෙළඳුන් විසින් මෝටර් වාහන විකුණනු ලැබූ දින සිට,

දින අනූවක් සම්පූර්ණවීමෙන් හෝ ඊට වැඩි කාලයක් ගතවීමෙන් පසුව, එම මෝටර් වාහනය මේ නියෝගවල II වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන වර්ගයට අයත් වන්නේ නම්, එම මෝටර් රථය ලියාපදිංචි කිරීමට ගෙවිය යුතු ගාස්තුව, එම උපලේඛනයේ II වැනි අයිතමයේ අනුරූප සටහනේ සඳහන් ප්‍රමාදවීමේ කාලසීමාව සැලකිල්ලට ගෙන එම උපලේඛනයේ III වැනි තීරයේ ඇති අනුරූප සටහනේ දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) එහි 6 වැනි නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

6 (1) මෙම නියෝගවල III වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන වර්ග සඳහා සාමාන්‍ය, ප්‍රමුඛතා හෝ එක් දින පදනම යටතේ මෝටර් වාහනයක අලුත් අයිතිකරුවකු වශයෙන් යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව, එම උපලේඛනයේ II, III සහ IV වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) මෝටර් වාහනයේ සන්තකය වෙනස් කිරීමේ දින සිට දින දාහතරක් ඇතුළත සාමාන්‍ය, ප්‍රමුඛතා හෝ එක් දින පදනම මත ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් භාර දී නැති අවස්ථාවක දී, ගෙවිය යුතු ගාස්තුව සමග එම පසු ගිය එක් එක් දිනය සඳහා රුපියල් සියයක අතිරේක ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය.

(3) මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරුවකුගේ මරණය සිදු වී ඇති අවස්ථාවක දී, ලියාපදිංචිය සඳහා වූ ඉල්ලීමක් එම මෝටර් වාහනයේ සන්තකය වෙනස්වීමේ දිනයෙන් පසුව දින එකසිය අසූවක් ඇතුළත සාමාන්‍ය පදනම මත භාර දිය යුතු ය. ගෙවිය යුතු ගාස්තුව සමග කල් ඉකුත් වූ එක් එක් දිනය සඳහා රුපියල් සියයක් වූ අතිරේක මුදලක් ද අයකරනු ලැබිය යුතු ය.

(4) රජයට හෝ අර්ධ - රාජ්‍ය සංවිධානයකට හෝ ශ්‍රී ලංකා රේගුවට අයත් වාහනයක් විකිණීමෙන් පසුව, ලියාපදිංචිය සඳහා වූ ඉල්ලීමක් එම විකිණීමේ දිනයෙන් පසුව දින එකසිය අසූවක් ඇතුළත සාමාන්‍ය පදනම මත භාර දිය යුතු ය. ගෙවිය යුතු ගාස්තුව සමග කල් ඉකුත් වූ එක් එක් දිනය සඳහා රුපියල් සියයක අතිරේක මුදලක් අයකරනු ලැබිය යුතු ය.

(3) එහි 8 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"8 (අ) පරම අයිතිකරු වශයෙන් යම් තැනැත්තෙකුගේ නම ලියාපදිංචි කිරීමේ ලේඛනය ඇතුළත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(i) සාමාන්‍ය පදනම මත රුපියල් දහසක් විය යුතු ය ;

(ii) ප්‍රමුඛතා පදනම මත රුපියල් එක් දහස් පන්සියයක් විය යුතු ය ;

(iii) එක් දින පදනම මත රුපියල් දෙදහසක් විය යුතු ය ; සහ

(ආ) පරම අයිතිකරුගේ නම ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු පහත සඳහන් පරිදි විය යුතු ය :-

(i) සාමාන්‍ය පදනම මත රුපියල් පන්සියයක් විය යුතු ය ;

(ii) ප්‍රමුඛතා පදනම මත රුපියල් හත්සිය පනහක් විය යුතු ය ;

(iii) එක් දින පදනම මත රුපියල් එක්දහස් දෙසීය පනහක් විය යුතු ය ;

(4) එහි 11 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"11 ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව පහත සඳහන් පරිදි විය යුතු ය :-

(අ) මෝටර් සයිකල් සඳහා රුපියල් හත්සියයක් විය යුතු ය ;

(ආ) මෝටර් සයිකල් හා මෝටර් ට්‍රයිසිකල් වෑන් සඳහා රුපියල් හත්සිය පනහක් විය යුතු ය ;

(ඇ) විදුලි බලයෙන්, සූර්ය බලයෙන්, ද්‍රව පැට්‍රෝලියම් වායුවෙන් හෝ විකල්ප ඉන්ධන මගින් ක්‍රියාත්මක වන වාහන සඳහා සමාන වාහන පන්තියකට අයත් සහ මෙම නියෝගවල V වන උපලේඛනයේ I සහ II වන තීරවල නිශ්චිතව දක්වා ඇති සමාන බරක් ඇති පෙට්‍රල් මෝටර් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තුවෙන් සියයට පනහක් විය යුතු ය ; සහ

(ඈ) විදුලි බලයෙන්, සූර්ය බලයෙන්, ද්‍රව පැට්‍රෝලියම් වායුවෙන් හෝ විකල්ප ඉන්ධන සමගින් ඛනිජ තෙල් නිෂ්පාදනයක් මගින් ක්‍රියාත්මක වන වාහන සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තුව මෙම නියෝගවල V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සමාන පන්තිවලට අයත් සමාන බරක් සහිත වාහනයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුවට සමාන විය යුතු ය ; ".

(5) මෙහි 15 වන නියෝගයේ "අත්ට්‍රැක්ටරය" යන යෙදුමේ අර්ථ නිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"ලොරි ට්‍රේලරයක් " යන්නෙන් තාර බර කිලෝ ග්‍රෑම් 750 ඉක්මවන්නා වූ යම් මෝටර් ලොරියකට, සැහැල්ලු මෝටර් ලොරියකට හෝ බර මෝටර් ලොරියක ට්‍රේලරයකට සම්බන්ධ කර ඇති භාණ්ඩ, ගෑස් හෝ ද්‍රව වර්ග ප්‍රවාහනය සඳහා සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන් ඉදි කර ඇති ට්‍රේලරයක් අදහස් වේ ;

(6) එහි I, II, III, V සහ VI වන උපලේඛන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කිරීමෙන් :-

(2 වන නියෝගය)

**I වන උපලේඛනය**

*පළමු ලියාපදිංචිය*

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *වාහන වර්ගය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය සී සී 1600 ට අඩු හෝ සී සී 1600 | 15,000.00 |
| 2. මෝටර් රථය සී සී 1600 ට වැඩි | 20,000.00 |
| 3. ද්විත්ව කාර්ය වාහනය | 15,000.00 |
| 4. ඉඩම් වාහනය | 7,000.00 |
| 5. අත් ට්‍රැක්ටරය | 1,500.00 |
| 6. විශේෂ කාර්ය වාහනය | 20,000.00 |
| 7. මෝටර් සයිකලය | 2,000.00 |
| 8. මෝටර් ට්‍රයිසිකලය | 2,500.00 |
| 9. මෝටර් ලොරිය | 3,000.00 |
| 10. මෝටර් කෝච් | 3,000.00 |
| 11. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | 3,000.00 |
| 12. මෝටර් ලොරි - ප්‍රයිම් මූවර් | 15,000.00 |
| 13. විකල්ප ඉන්ධන වලින් හෝ ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් ක්‍රියාත්මක වන මෝටර් වාහනය | 1,500.00 |
| 14. විදුලි බලයෙන් සහ/හෝ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන වාහනය | 1,500.00 |
| 15. ආබාධිතයන් සඳහා වූ රථය | 1,000.00 |
| 16. මෝටර් ගිලන් රථය | 10,000.00 |
| 17. මෝටර් අවමංගල රථය | 10,000.00 |
| 18. ලොරි ට්‍රේලරය | 7,500.00 |
| 19. ට්‍රැක්ටරය / ට්‍රේලරය | 6,000.00 |

(3 වන නියෝගය)

**II වන උපලේඛනය**

*ප්‍රමාද වූ පළමු ලියාපදිංචිය*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන වර්ගය* | *ප්‍රමාද වීමේ කාලය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 6,000.00<br>7,500.00<br>10,000.00<br>15,000.00<br>25,000.00 |

**II** වන උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරය* | *II වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| වාහන වර්ගය | ප්‍රමාද වීමේ කාලය | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 2. ද්විත්ව කාර්ය වාහනය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 6,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 7,500.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 10,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 15,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 25,000.00 |
| 3. ඉඩම් වාහනය (කෘෂිකාර්මික) | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 2,500.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 4,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 5,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 6,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 7,500.00 |
| 4. අත් ට්‍රැක්ටරය - පාවිච්චි කළ | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 1,750.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 2,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 2,500.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 3,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 4,000.00 |
| 5. විශේෂ කාර්ය වාහනය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 3,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 5,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 7,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 9,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 10,000.00 |
| 6. මෝටර් සයිකලය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 1,500.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 1,750.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 2,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 2,500.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 4,000.00 |
| 7. මෝටර් ට්‍රයිසිකලය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 2,500.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 3,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 4,000.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 5,000.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 6,000.00 |
| 8. මෝටර් ලොරිය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 4,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 5,000.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 6,800.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 7,800.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 9,800.00 |
| 9. මෝටර් කෝච් | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු | 7,000.00 |
| | අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු | 8,400.00 |
| | අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු | 9,500.00 |
| | අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු | 10,500.00 |
| | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 13,500.00 |

**II** වන උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරය* | *II වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| වාහන වර්ගය | ප්‍රමාද වීමේ කාලය | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 10. මෝටර් ට්‍රයිසිකල් වෑන් | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 3,000.00<br>4,000.00<br>5,000.00<br>7,000.00<br>9,000.00 |
| 11. මෝටර් ලොරි - ප්‍රයිම් මුවර්ස් | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 4,000.00<br>5,000.00<br>7,000.00<br>9,000.00<br>10,000.00 |
| 12. විකල්ප ඉන්ධන වලින් හෝ ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් ක්‍රියාත්මක වන මෝටර් වාහනය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 2,000.00<br>2,500.00<br>3,000.00<br>3,500.00<br>4,000.00 |
| 13. විදුලි බලයෙන් සහ / හෝ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන වාහනය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 2,000.00<br>2,500.00<br>3,000.00<br>3,500.00<br>4,000.00 |
| 14. ආබාධිතයින් සඳහා වූ රථය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 2,000.00<br>2,500.00<br>3,000.00<br>4,000.00<br>5,000.00 |
| 15. මෝටර් ගිලන් රථය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 2,000.00<br>2,500.00<br>3,000.00<br>4,000.00<br>4,500.00 |
| 16. මෝටර් අවමංගල රථය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 6,000.00<br>7,000.00<br>8,000.00<br>9,000.00<br>10,000.00 |
| 17. මෝටර් ලොරිය/ට්‍රේලරය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 5,000.00<br>6,000.00<br>7,000.00<br>8,000.00<br>9,000.00 |
| 18. ට්‍රැක්ටරය / ට්‍රේලරය | දින 90 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 ක් හෝ ඊට වැඩි | 2,000.00<br>3,000.00<br>4,000.00<br>5,000.00<br>6,000.00 |

(6 වන නියෝගය)

**III** වන උපලේඛනය

*නව අයිතිකරුවන් ලියාපදිංචි කිරීම*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|
| *වාහන වර්ගය* | *සාමාන්‍ය පදනම මත ගාස්තුව (රු.)* | *ප්‍රමුඛතා පදනම මත ගාස්තුව (රු.)* | *එක් දින පදනම මත ගාස්තුව (රු.)* |
| 1. මෝටර් රථය | 2,500.00 | 3,250.00 | 3,750.00 |
| 2. ද්විත්ව කාර්ය වාහනය | 2,500.00 | 3,250.00 | 3,750.00 |
| 3. ඉඩම් වාහනය - (කෘෂිකාර්මික) | 500.00 | 650.00 | 1,150.00 |
| 4. ඉඩම් වාහනය - (කෘෂිකාර්මික නොවන) | 1,000.00 | 1,300.00 | 1,800.00 |
| 5. ඉඩම් වාහනය - (රෝද හතරේ ට්‍රැක්ටරය) | 1,200.00 | 1,560.00 | 2,060.00 |
| 6. අත් ට්‍රැක්ටරය | 500.00 | 650.00 | 1,150.00 |
| 7. මෝටර් සයිකලය | 500.00 | 650.00 | 1,150.00 |
| 8. මෝටර් ට්‍රයිසිකලය | 500.00 | 650.00 | 1,150.00 |
| 9. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | 500.00 | 650.00 | 1,150.00 |
| 10. මෝටර් ලොරිය | 2,500.00 | 3,250.00 | 3,750.00 |
| 11. මෝටර් ලොරිය - (ෆෝක් ලිෆ්ට්) | 2,500.00 | 3,250.00 | 3,750.00 |
| 12. මෝටර් ලොරි - (ප්‍රයිම් මූවර්) | 2,500.00 | 3,250.00 | 3,750.00 |
| 13. මෝටර් කෝච් | 2,500.00 | 3,250.00 | 3,750.00 |
| 14. ආබාධිතයන් සඳහා වූ රථය | 500.00 | 650.00 | 1,150.00 |
| 15. මෝටර් ගිලන් රථය | 1,000.00 | 1,300.00 | 1,800.00 |
| 16. මෝටර් අවමංගල රථය | 1,000.00 | 1,300.00 | 1,800.00 |
| 17. ලොරි ට්‍රේලරය | 2,000.00 | 2,600.00 | 3,100.00 |
| 18. ට්‍රැක්ටරය / ට්‍රේලරය | 1,000.00 | 1,300.00 | 1,800.00 |
| 19. විකල්ප ඉන්ධන වලින් හෝ ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් ක්‍රියාත්මක වන මෝටර් වාහනය | 800.00 | 1,040.00 | 1,540.00 |
| 20. විදුලි බලයෙන් සහ/හෝ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන වාහනය | 800.00 | 1,040.00 | 1,540.00 |
| 21. විශේෂ කාර්ය වාහනය | 2,500.00 | 3,250.00 | 3,750.00 |

(9 වන නියෝගය)

V වන උපලේඛනය

*වාර්ෂික ආදායම් බලපත්‍රය*

I වන කොටස

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන පන්තිය* | *බර පැටවීමට පෙර බර* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| මෝටර් රථය | *(අ)* (i) කි. ග්‍රෑ. 762 දක්වා (පෙට්‍රල්) | 2,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 762 දක්වා (ඩීසල්) | 3,100.00 |
| | *(ආ)* (i) කි. ග්‍රෑ. 762 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,016 ට අඩු (පෙට්‍රල්) | 2,200.00 |

*වාර්ෂික ආදායම් බලපත්‍රය* (සම්බන්ධිතයි)

*I වන කොටස*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන පන්තිය* | *බර පැටවීමට පෙර බර* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| මෝටර් රථය | (ii) කි. ග්‍රෑ. 762 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,016 ට අඩු (ඩීසල්) | 4,000.00 |
| | (*ඇ*) (i) කි. ග්‍රෑ. 1,016 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,270 ට අඩු (පෙට්‍රල්) | 3,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 1,016 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,270 ට අඩු (ඩීසල්) | 6,000.00 |
| | (*ඈ*) (i) කි. ග්‍රෑ. 1,270 ක් හෝ ඊට වැඩි (පෙට්‍රල්) | 4,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 1,270 ක් හෝ ඊට වැඩි (ඩීසල්) | 8,000.00 |

*II වන කොටස*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන පන්තිය* | *දළ බර* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 1. මෝටර් ලොරිය, මෝටර් ගිලන් රථය, මෝටර් අවමංගල රථය, විශේෂ කාර්ය වාහනය | (*අ*) (i) කි. ග්‍රෑ. 2,000 දක්වා (පෙට්‍රල්) | 1,500.00 |
| | (ii) කි. ග්‍රෑ. 2,000 දක්වා (ඩීසල්) | 3,000.00 |
| | (*ආ*) (i) කි. ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 5000 ට අඩු (පෙට්‍රල්) | 2,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 5000 ට අඩු (ඩීසල්) | 4,000.00 |
| | (*ඇ*) (i) කි. ග්‍රෑ. 5,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 10,000 ට අඩු (පෙට්‍රල්) | 2,500.00 |
| | (ii) කි. ග්‍රෑ. 5,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 10,000 ට අඩු (ඩීසල්) | 6,000.00 |
| | (*ඈ*) (i) කි. ග්‍රෑ. 10,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 15,000 ට අඩු (පෙට්‍රල්) | 3,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 10,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 15,000 ට අඩු (ඩීසල්) | 7,000.00 |
| | (*ඉ*) (i) කි. ග්‍රෑ. 15,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 20,000 ට අඩු (පෙට්‍රල්) | 4,500.00 |
| | (ii) කි. ග්‍රෑ. 15,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 20,000 ට අඩු (ඩීසල්) | 10,000.00 |
| | (ඊ) (i) කි.ග්‍රෑ. 20,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ .25,000 ට අඩු (පෙට්‍රල්) | 4,600.00 |
| | (ii) කි. ග්‍රෑ. 20,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 25,000 ට අඩු (ඩීසල්) | 12,000.00 |
| | (*උ*) (i ) කි.ග්‍රෑ. 25,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 30,000 ට අඩු (පෙට්‍රල්) | 6,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 25,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 30,000 ට අඩු (ඩීසල්) | 14,000.00 |
| | (*ඌ*) (i ) කි.ග්‍රෑ. 30,000 ක් හෝ ඊට වැඩි (පෙට්‍රල්) | 7,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 30,000 ක් හෝ ඊට වැඩි (ඩීසල්) | 15,000.00 |
| 2. ද්විත්ව කාර්ය වාහන | (*අ*) (i ) කි.ග්‍රෑ. 1,000 දක්වා (පෙට්‍රල්) | 2,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 1,000 දක්වා (ඩීසල්) | 3,500.00 |
| | (*ආ*) (i ) කි.ග්‍රෑ. 1,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 1,500 ට අඩු (පෙට්‍රල්) | 2,200.00 |
| | (ii) කි. ග්‍රෑ. 1,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,500 ට අඩු නොවන (ඩීසල්) | 4,000.00 |

**II වන කොටස (සම්බන්ධිතයි)**

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| වාහන පන්තිය | දළ බර | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| | (ඇ) (i ) කි.ග්‍රෑ. 1,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,000 ට අඩු (පෙට්‍රල්) | 2,700.00 |
| | (ii) කි. ග්‍රෑ. 1,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,000 ට අඩු (ඩීසල්) | 4,200.00 |
| | (ඈ) (i ) කි.ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,500 ට අඩු (පෙට්‍රල්) | 3,100.00 |
| | (ii) කි. ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,500 ට අඩු (ඩීසල්) | 5,500.00 |
| | (ඉ) (i ) කි.ග්‍රෑ. 2,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,000 ට අඩු (පෙට්‍රල්) | 4,200.00 |
| | (ii) කි. ග්‍රෑ. 2,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,000 ට අඩු (ඩීසල්) | 9,000.00 |
| | (ඊ) (i ) කි.ග්‍රෑ. 3,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 3,500 ට අඩු (පෙට්‍රල්) | 10,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 3,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,500 ට අඩු (ඩීසල්) | 10,000.00 |
| | (උ) (i ) කි.ග්‍රෑ. 3,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 4,000 ට අඩු (පෙට්‍රල්) | 12,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 3,500 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 4,000 ට අඩු (ඩීසල්) | 12,000.00 |
| | (ඌ) (i ) කි.ග්‍රෑ. 4,000 ක් හෝ ඊට වැඩි (පෙට්‍රල්) | 15,000.00 |
| | (ii) කි. ග්‍රෑ. 4,000 ක් හෝ ඊට වැඩි (ඩීසල්) | 15,000.00 |
| 3. (ට්‍රැක්ටරය/ට්‍රේලරය, ට්‍රේලරය සහිත අත් ට්‍රැක්ටරය ඇතුළු)ඉඩම් වාහනය | (අ) කි. ග්‍රෑ. 1,778 දක්වා | 450.00 |
| | (ආ) කි. ග්‍රෑ. 1,778 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2,032 ට අඩු | 900.00 |
| | (ඇ) කි. ග්‍රෑ. 2,032 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,540 ට අඩු | 1,100.00 |
| | (ඈ) කි. ග්‍රෑ. 2,540 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,048 ට අඩු | 1,300.00 |
| | (ඉ) කි. ග්‍රෑ. 3,048 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,556 ට අඩු | 1,550.00 |
| | (ඊ) කි. ග්‍රෑ. 3,556 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 5,080 ට අඩු | 1,650.00 |
| | (උ) කි. ග්‍රෑ. 5,080 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 15,240 ට අඩු | 2,400.00 |
| | (ඌ) කි. ග්‍රෑ. 15,240 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 25,400 ට අඩු | 2,750.00 |
| | (එ) කි. ග්‍රෑ. 25,400 ක් හෝ ඊට වැඩි | 3,300.00 |
| 4. ලොරි ට්‍රේලරය | (අ) කි. ග්‍රෑ. 751 සිට කි. ග්‍රෑ. 2000 දක්වා | 3,000.00 |
| | (ආ) කි. ග්‍රෑ. 2,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 5,000 ට අඩු | 4,000.00 |
| | (ඇ) කි. ග්‍රෑ. 5,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 10,000 ට අඩු | 6,000.00 |
| | (ඈ) කි. ග්‍රෑ. 10,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 15,000 ට අඩු | 7,000.00 |
| | (ඉ) කි. ග්‍රෑ. 15,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 20,000 ට අඩු | 10,000.00 |
| | (ඊ) කි. ග්‍රෑ. 20,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 25,000 ට අඩු | 12,000.00 |
| | (උ) කි. ග්‍රෑ. 25,000 ක් හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 30,000 ට අඩු | 14,000.00 |
| | (ඌ) කි. ග්‍රෑ. 30,000 ක් හෝ ඊට වැඩි | 15,000.00 |

(10 වැනි නියෝගය)

**VI** වැනි උපලේඛනය

*වාර්ෂික ආදායම් බලපත්‍රය*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| වාහන පන්තිය | (එක් මගී ආසනයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව) (රු.) |
| (1) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට සහ/හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ | 40.00 |
| (2) මෙහි (1) වැනි අයිතමය යටතේ සඳහන්ව නොමැති යම් තැනැත්තකුට අයත් ඔම්නි බස්රථ | 150.00 |
| (3) පෞද්ගලික මෝටර් කෝච් | 500.00 |

(7) VIII වන උපලේඛනයේ 8 වන අයිතමයේ (7) වන අනු - අයිතමය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| කාර්යයන් | ගාස්තුව (රු.) |
| "(7) (අ) CC 1000 ට ඉහල එන්ජින් ධාරිතාවක් ඇති ; | 25,000.00 |
| (ආ) CC 1000 ට අඩු එන්ජින් ධාරිතාවක් ඇති ; | 500.00" |
| මෝටර් ලොරියක හෝ ද්විත්ව කාර්යය වාහනයක බොඩියේ නිර්මාණය වෙනස් කිරීම. | |

02 - 780

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.
2 - PG 001554